මධ්‍යම පළාත

මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන, ප්‍රවාහන, විදුලිබල හා බලශක්ති සහ නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය

මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය

පුරප්පාඩු

මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ පහත දැක්වෙන තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය හා පාලන) - තනතුරු 01

i. **තනතුරු නාමය** - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය හා පාලන)

ii. **සේවා ගණය** - ජ්‍යෙෂ්ඨ කළමනාකාර (HM 1-1)

iii. **වැටුප් පරිමාණය** - කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 අනුව,

HM 1-1 2025 - 140,640 - 15 X 4100 - 202,140 /-

iv. **මූලික වැටුප** - රු.140,640/- ක මූලික වැටුප හිමිවනු ලබන්නේ 2027.01.01 දින සිටය. බඳවාගැනීමේ ආරම්භක වැටුප් පියවර කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 දරන චක්‍රලේඛයේ උපලේඛන II හි සඳහන් පරිදි රු. 123,019 /- කි. නොගෙවන වැටුප රු. 17,621 /- කි.

v. **සුදුසුකම්** -

බාහිර අයදුම්කරුවන් (පහත සඳහන් 1 හෝ 2)

1. ගණකාධිකරණය/වාණිජවේදී විෂය ක්ෂේත්‍රයකින් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබාතිබීම.

සමඟ

එකී ක්ෂේත්‍රයකින් පශ්චාත් උපාධියක් (Master) ලබා තිබීම/ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයකට ගැලපෙන්නා වූ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම සහ රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකාර මට්ටමේ තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර 15 ක පළපුරුද්ද ලබා තිබීම.

2. ගණකාධිකරණය පිළිබඳ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක පූර්ණ සාමාජිකත්වය ලබාතිබීම.

සහ

රජයේ, රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකාර මට්ටමේ තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර 15 ක පළපුරුද්ද ලබා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත සඳහන් 1 හෝ 2)

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

2. "කළමනාකාර" (MM 1-1) සේවා ගණයෙහි I වන ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) අදාළ විෂය ක්ෂේත්‍රයේ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

vi. **වයස** - වයස අවු. 35 ට නොඅඩුවා හා අවු.55 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

vii. මාර්ග ඉදිකිරීම් ක්ෂේත්‍රය තුළ සේවා පලපුරුද්ද සඳහා සම්මුඛ පරීක්ෂණයේදී ප්‍රමුඛතාවයක් දෙනු ලැබේ.

කළමනාකාර සහකාර (තාක්ෂණික නොවන) - තනතුරු 05

i. **තනතුරු නාමය** - කළමනාකාර සහකාර (තාක්ෂණික නොවන)

ii. **සේවා ගණය** - කළමනාකාර සහකාර (තාක්ෂණික නොවන) (MA 1-1)

iii. **වැටුප් පරිමාණය** - කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 අනුව,

MA 1-1 2025 - 46,220 - 10X540 - 7X630- 4X890- 20X1190 - 83,390/-

vi. **මූලික වැටුප** - රු.46,220 /- ක මූලික වැටුප හිමිවනු ලබන්නේ 2027.01.01 දින සිටය. බඳවාගැනීමේ ආරම්භක වැටුප් පියවර කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 දරන චක්‍රලේඛයේ උපලේඛන II හි සඳහන් පරිදි රු. 43,312 /- කි. නොගෙවන වැටුප රු. 2,909/- කි.

v. **බඳවා ගන්නා ශ්‍රේණිය** - III ශ්‍රේණිය

vi. **සුදුසුකම්** -

බාහිර අයදුම්කරුවන්

අධ්‍යාපන -

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී

i. සිංහල / දෙමළ
ii. ගණිතය

ඇතුලුව විෂයයන් හතරකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවරකදී විෂයන් (06) කින් සමත්ව තිබීම.

සහ

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී සියලුම විෂයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත්ව තිබීම . පැරණි විෂය නිර්දේශය යටතේ විෂයයන් තුනකින් (03) එක්වර සමත්ව තිබීම ප්‍රමාණවත් වේ.

(ඇ) පරිගණක වදන් සැකසුම/යතුරු ලියනය පිළිබඳ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා පාඨමාලාවක් හදාරා තිබීම හෝ වෙනත් ඒ හා මට්ටමේ නිපුණතාවන් අදාළ අවස්ථාවන්හිදී සුදුසුකම් වශයෙන් තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන්

(අ) ප්‍රාථමික ශ්‍රේණිය - ශිල්පීය නොවන, අර්ධ ශිල්පීය සහ ශිල්පීය සේවා ගණයෙහි පහත "ආ", "ඇ" සහ "ඉ" සඳහන් සුදුසුකම් ඇති සේවකයින්ට මේ සඳහා අයදුම් කළ හැක.

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී ,

i. සිංහල/දෙමළ
ii. ගණිතය

ඇතුලුව විෂයන් හතරකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවරක දී විෂයන් (06) කින් සමත්ව තිබීම.

(පරිගණක වදන් සැකසුම/යතුරු ලියනය පිළිබඳ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා පාඨමාලාවන් හදාරා තිබීම හෝ වෙනත් ඒ හා මට්ටමේ නිපුණතාවයන් අදළ අවස්ථාවන්හිදී සුදුසුකම් වශයෙන් තිබීම.)

(ඇ) සේවයෙහි ස්ථිර පත්වීම් දැරිය යුතු අතර, එම පත්වීම් වල ස්ථිර කරනු ලැබ සිටිය යුතුය.

(ඉ) නියමිත දිනට පූර්වාසන්න ස්ථිර පත්වීමකට යටත් පිරිසෙයින් වසර පහ (05) ක අඛණ්ඩ "සතුටුදායක සේවා කාලයක්" සම්පූර්ණ කොට තිබිය යුතුය.

සටහන් - යම් තනතුරකට ස්ථිරව පත් කරනු ලැබීමට පෙර සේවය කර ඇත්නා වූ හෝ යම් තනතුරකට ස්ථිර වශයෙන් පත් කිරීම සඳහා කොන්දේසියක් වශයෙන් සේවය කර ඇත්නා වූ පුහුණුවීමේ කාලපරිච්ඡේදයක් ඉහත (ආ) ඡේදයෙහි සඳහන් සුදුසුකම් ලැබීමේ පස් අවුරුදු කාල සීමාට ගණන් ගනු නොලැබේ. යම් තනතුරකට ස්ථිර වශයෙන් පත් කරනු ලැබීමට පෙර සේවය කර ඇති තාවකාලික/අනියම් සේවා කාල පරිච්ඡේද ඉහත "ආ" ඡේදයෙහි සඳහන් සුදුසුකම් ලැබීමේ පස්අවුරුදු කාලසීමාව සඳහා ගණන් ගනු නොලැබේ.

vii. **වයස** - අවු.18 ට නොඅඩු විය යුතු අතර හා අවු.45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

බර යන්ත්‍ර ක්‍රියාකරු - තනතුරු 09

i. **තනතුරු නාමය** - බර යන්ත්‍ර ක්‍රියාකරු

ii. **සේවා ගණය** - ප්‍රාථමික ශිල්පීය (PL -3)

iii. **වැටුප් පරිමාණය** - කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 අනුව,

PL 3-2025 - 43,280-10X490-10X540-10X590-12X630-67,040/-

iv. **මූලික වැටුප** - රු.43,280 /- ක මූලික වැටුප හිමිවනු ලබන්නේ 2027.01.01 දින සිටය. බඳවාගැනීමේ ආරම්භක වැටුප් පියවර කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 දරන චක්‍රලේඛයේ උපලේඛන II හි සඳහන් පරිදි රු. 40,834 /- කි. නොගෙවන වැටුප රු. 2,447/- කි.

v. **බඳවා ගන්නා ශ්‍රේණිය** - III ශ්‍රේණිය

vi. **සුදුසුකම්** -

බාහිර අයදුම්කරුවන්

ප්‍රවීණතා -

1. මොටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කල බර වාහන පැදවීම් සඳහා වූ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම සමඟ බර යන්ත්‍ර හැසිරවීම සම්බන්ධයෙන් ඉදිකිරීම් ඉංජිනේරු ආයතනය විසින් ලබාදෙනු ලබන (NVQ) හතරවෙනි (04) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබාතිබීම සහ බර යන්ත්‍ර ක්‍රියාකරවීම සම්බන්ධයෙන් අවම වශයෙන් වසර තුනක (03) පලපුරුද්දක් ලබා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන්

ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

vii. **වයස** - අවු. 18 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

රියදුරු - තනතුරු 10

i. **තනතුරු නාමය** - රියදුරු

ii. **සේවා ගණය** - ප්‍රාථමික ශිල්පීය (PL -3)

iii. **වැටුප් පරිමාණය** - කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 අනුව,

PL 3 -2025 - 43,280-10X490-10X540-10X590-12X630-67,040/-

iv. **මූලික වැටුප** - රු.43,280 /- ක මූලික වැටුප හිමිවනු ලබන්නේ 2027.01.01 දින සිටය. බඳවාගැනීමේ ආරම්භක වැටුප් පියවර කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 දරන චක්‍රලේඛයේ උපලේඛන II හි සඳහන් පරිදි රු. 40,834 /- කි. නොගෙවන වැටුප රු. 2,447/- කි.

v. **බඳවා ගන්නා ශ්‍රේණිය** - III ශ්‍රේණිය

vi. **සුදුසුකම්** -

බාහිර අයදුම්කරුවන් -

අධ්‍යාපන සුදුසුකම් -

1. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙල) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකින් යටත් පිරිසෙයින් සම්මාන දෙකක් (02) සහිතව විෂයයන් හයකින් (06) සමත් වීම.

ප්‍රවීණතා -

1. මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කල බර වාහන පැදවීම සඳහා වූ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබාතිබීම සහ රියදුරු බලපත්‍රය ලැබීමෙන් පසු රිය පැදවීම සම්බන්ධයෙන් අවම වශයෙන් වසර තුනක (03) පලපුරුද්දක් ලබා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන්

1. මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කල බර වාහන පැදවීම සඳහා වූ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම සහ රියදුරු බලපත්‍රය ලැබීමෙන් පසු රිය පැදවීම සම්බන්ධයෙන් අවම වශයෙන් වසර තුනක (03) පලපුරුද්දක් ලබා තිබීම

සහ

ප්‍රාථමික අර්ථ ශිල්පීය (PL-2) හෝ ප්‍රාථමික ශිල්පීය නොවන (PL-1) සේවා ගණයක වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

vii. **වයස** - අවු. 18 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

ඉංජිනේක්ටර් පොම්ප ක්‍රියාකරු - තනතුරු 01

i. **තනතුරු නාමය** - ඉංජිනේක්ටර් පොම්ප ක්‍රියාකරු

ii. **සේවා ගණය** - ප්‍රාථමික අර්ධ ශිල්පීය (PL 2)

iii. **වැටුප් පරිමාණය** - කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 අනුව,

PL 2 -2025 - 42,300-10X490-10X540-10X590-12X630-66,060/-

iv. **මූලික වැටුප** - රු.42,300/- ක මූලික වැටුප හිමිවනු ලබන්නේ 2027.01.01 දින සිටය. බඳවාගැනීමේ ආරම්භක වැටුප් පියවර කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 දරන චක්‍රලේඛයේ උපලේඛන II හි සඳහන් පරිදි රු. 40,008 /- කි. නොගෙවන වැටුප රු. 2,293/- කි.

v. **බඳවා ගන්නා ශ්‍රේණිය** - III ශ්‍රේණිය

vii. **සුදුසුකම්** -

බාහිර අයදුම්කරුවන්

1. ඉංජිනේක්ටර් පොම්ප ක්‍රියාකරවීම සම්බන්ධයෙන් තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවය (NVQ) දෙවැනි (02) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන්

1. ඉංජිනේක්ටර් පොම්ප ක්‍රියාකරවීම සම්බන්ධයෙන් වසර පහක (05) පලපුරුද්ද සහ කාර්මික විද්‍යුලයකින් / වෘත්තීය පුහුණු ආයතනයකින් අදළ තනතුරෙහි කාර්යභාරයට අනුකූල වන වෘත්තීය පරීක්ෂණයකදී (Trade test) තහවුරු කෙරෙන ජාතික වෘත්තීය කුසලතාවය (NVQ) දෙවැනි (02) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතාවය සහිත ප්‍රාථමික ශිල්පීය නොවන (PL 1) සේවා ගණයක සේවකයින්

2. ඉංජිනේක්ටර් පොම්ප ක්‍රියාකරවීම සම්බන්ධයෙන් තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික /වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාව (NVQ) දෙවැනි (02) මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

vii. **වයස** - අවු. 18 ට නොඅඩුවා හා අවු. 45 ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

පොදු කොන්දේසි

1. ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.

2. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර තුනට (03) නොඅඩු කාලයක් මධ්‍යම පළාත තුල ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.

3. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම මධ්‍යම පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

4. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

5. සෑම අයදුම්කරුවෙකුම තනතුරට බඳවා ගැනීම සඳහා අදළ වන සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවන අවසන් දිනට හෝ ඊට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

6. අධිකාරියේ ස්ථිර පත්වීම් ලද අය පමණක් අභ්‍යන්තර අයදුම්කරුවන් ලෙස සලකනු ලැබේ.

7. රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක සේවය කරනු ලබන්නේ නම් ආයතන ප්‍රධානියා මඟින් අයදුම්පත ඉදිරිපත් කල යුතුයි.

8. අයදුම්කරුවන් විසින් තමාගේ ජීව දත්ත අඩංගු අයදුම්පත සකස් කර එවිය යුතු අතර, තමා පිළිබඳ තොරතුරු ලබා ගත හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම් සඳහන් කර එවිය යුතුය.

9. ඔබ විසින් යොමු කරනු ලබන අයදුම්පත්‍රයේ සඳහන්ව ඇති යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් නුසුදුස්සෙකු සේ සලකා ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට කටයුතු කරනු ලැබේ.එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදළ ක්‍රියාමාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

10. මාර්ග ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සේවා පලපුරුද්ද සඳහා සම්මුඛ පරීක්ෂණයේදී ප්‍රමුඛතාවයක් දෙනු ලැබේ.

බඳවා ගන්නා ක්‍රමය -

- **නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය හා පාලන), කළමනාකාර සහකාර (තාක්ෂණික නොවන)** තනතුරු සඳහා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින් බඳවා ගනු ලැබේ.
- **බර යන්ත්‍ර ක්‍රියාකරු, රියදුරු, ඉංජිනේක්ටර් පොම්ප ක්‍රියාකරු** තනතුරු සඳහා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් හා වෘත්තීය ප්‍රායෝගික පරීක්ෂණයක් මඟින් බඳවා ගනු ලැබේ.

මෙම දැන්වීමේ සඳහන් සුදුසුකම් සපුරන ලද අයදුම්කරුවන් පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත දිනට හෝ එදිනට පෙර ඉල්ලුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම්කරු කැඳවීම මෙම තනතුර සඳහා පත් කිරීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් විසින් ජීව දත්ත විස්තර ඇතුලත් කර සකස් කරන ලද අයදුම්පත් අදළ සහතිකවල පිටපත්ද (සහතික කරන ලද) සමඟ බහා එවනු ලිපි කවරයේ වම් පස ඉහල කෙළවරෙහි ඉල්ලුම් කරන

තනතුරු නාමය පැහැදිලිව සඳහන් කර 2026.11.16 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් යොමු කල යුතුය.

ඔබ එක් තනතුරකට වඩා අයදුම් කරන්නේ නම්, එක් එක් තනතුර සඳහා වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කල යුතු අතර, අයදුම් කරන තනතුර සෑම අයදුම්පතකම සහ ලිපි කවරයේ පැහැදිලිව සඳහන් කල යුතුය.

2026.11.16 දිනට පසු ලැබෙන අයදුම්පත්, අයදුම්පත බහාලන ලිපි කවරයේ තනතුර සඳහන් කර නොමැති අයදුම්පත්, අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීම සිදු කරනු ලැබේ.

මෙම බඳවා ගැනීම් සම්බන්ධයෙන් මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

සාමාන්‍යාධිකාරී,
පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය,
මධ්‍යම පළාත.

පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය,
අංක 09,
ඇහැලේපොල කුමාරිහාමි මාවත,
බෝගම්බර, මහනුවර.
දුරකථන අංකය : 081-2204378